Upholding 30 Years of Excellence in Human Rights Education & Research
**Centre for the Study of Human Rights**
**Faculty of Law, University of Colombo, Sri Lanka**

10.03.2022

ගරු මහත්මියණි, මහත්මයාණනි,

**කොළඹ විශ්වවිද්‍යාලයේ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය මඟින් පිරිනමනු ලබන නව පාඨමාලා පිළිබඳ දැනුවත් කිරීම**

කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට අනුබද්ධිත ආයතනයක් වන මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන පහත සඳහන් පාඨමාලා මෙම වසරේත් පිරිනමනු ලබන බව ඔබට සතුටින් දන්වා සිටිමු.

- ළමා රැකවරණය හා අයිතිවාසිකම් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (මාස 03)
- ළමා රැකවරණය හා අයිතිවාසිකම් පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව (මාස 06)
- මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (මාස 03)
- නීතිය හා පුරවැසියා පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (මාස 03)

මෙම පාඨමාලාවේ දේශන මාර්ගගත ක්‍රමය ඔස්සේ සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයෙන්ම පැවැත්වෙන අතර පාඨමාලා අවසානයේ ඔබට කොළඹ විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන පිළිගත් වටිනා සහතිකයක් හිමිවනු ඇත.

නීතිය හා මානව හිමිකම් පිළිබඳ වැඩිදුර ඉගෙනීමට කැමති ඕනෑම කෙනෙකුට මෙය මහඟු අවස්ථාවක් වනු ඇත. මේ සමඟ ඒ පිළිබඳ තොරතුරු ඇතුලත් දැන්වීම් පත්‍රිකාවක් මේ සමඟ අමුණා ඇත. මේ පිළිබඳ ඔබ ආයතනයේ නිලධාරීන් දැනුවත් කරන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

ඔබට අප ආයතනයේ වෙනත් පාඨමාලා සම්බන්ධ තොරතුරු සහ අයැදුම් පත්‍ර cshr.cmb.ac.lk වෙතින් ලබා ගත හැකි අතර අයැදුම් කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයැදුම් පත්‍රය info@cshr.cmb.ac.lk වෙත යොමු කල යුතුයි.

අධ්‍යක්ෂ
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය,
94, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

ස්තුතියි

Herath. 10/03/22

Centre for the study of Human Rights
Faculty of Law
University of Colombo
94, Cumaratunga Munidasa Mawatha
Colombo - 3.

නීතිඥ ලේඛා හේරත්
ව්‍යාපෘති නිළධාරී